# යෙදවුම්

- **පොල් පැළ**

පොලි බෑග් පැළ සහ බිම් පැළ  ලෙස පැළ වර්ග 2 ක් ඇත. මෙම පැළ වර්ග 2 ම සහනාදායී මිලට පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් මිලදී ගත හැක. එහිදී රු.250/= ක්  වටිනා පොලි බෑග් පැළයක් රු. 150/= කටද රු.175/= ක් වටිනා බිම් පැළයක් රු.75/= කටද පොල වගාකිරීමේ මණ්ඩලයෙන් මිලදී ගත හැක ඒ අනුව ඔබ මිලදී ගනු ලබන සෑම පොල් පැළයක් සඳහාම රු. 100/= ක සහනාධාරයක්  රජය විසින් දරනු ඇත.

- **මයිටා පැකට්**

පොල්  අස්වැන්නට  හානි කරනු ලබන මයිටාවන්  ආහාරයට ගන්නා පරපෝෂී මයිටාවන් මෙම පැකට් තුළ අසුරා ඇත. මේවා පොල වගාකිරීමේ මණ්ඩලයේ රසායනාගාර තුළ  නිෂ්පාදනය කරනු ලබයි. ඒ සඳහා රු.45/= ක් වැය වුවත්  රු. 25 සහනදායී මිල යටතේ මෙම පරපෝසී පැකට් පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් ලබාගත හැක. එහිදී ඔබ මිලදී ගනු ලබන සෑම පරපෝෂී  පැකට්ටුවකටම රු.20/= ක සහනාධාරයක් රජය විසින් දරනු ලැබේ. මෙම පරපෝෂී පැකට් විශේෂිත තත්ත්වයන් යටතේ  ගබඩා කර තබන හෙයින්  ඔබට මේවා මිලදී ගත හැක්කේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල වලින් සහ විද්‍යාගාර වලින් පමණි.

- **රතු කුරුමිණි පෙරමෝන**

මෙම පෙරමෝනවල අඩංගු රසායනික ද්‍රව්‍ය  නිසා ඔබගේ පොල් ඉඩමේ විවිධ  ප්‍රදේශවල වෙසෙන රතු කුරුමිණියන් එක් ස්ථානයකට ආකර්ශනය කරගත හැක. එමඟින්  ඔවුන් විනාශ  කිරීමට පහසු වනු ඇත. මේවා  පොල් වගාකිරීමේ මණ්ඩලයේ රසායනාගාරවල නිෂ්පාදනය කරන අතර ඒවා සහනාදායී මිලට පොල් වගාකිරීමේ ප්‍රාදේශීය කාර්යාලවලින් මිලදී ගතහැක.

- **කළු කුරුමිණි පෙරමෝන**

ඔබගේ පොල් ඉඩමේ විවිධ  ප්‍රදේශවල සිටින කළු කුරුමිණියන්ගේ  මෙහි අඩංගු රසායනික ද්‍රව්‍ය මඟින් එක් ස්ථානයකට ආකර්ශනය කර දේ. එමඟින් ඔවුන් පහසුවෙන්ම විනාශ කළ හැක. මේවා සහනදායී මිලට පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවලින් මිලදී ගතහක.

- මොනොක්‍රොටපොස්

අධික විෂ සහිත ද්‍රව්‍යයකි. පොල් ගස රතු කුරුමිණි උවදුරට ගොදුරු වූ විට පමණක් ඔවුන් විනාශ කිරීම සඳහා මොනොක්‍රොටොපොස් භාවිතා කළ හැක. මොනොක්‍රොටොපොස් ලබා ගැනීමට නම් සැම විටම ඔබගේ ඉඩම පොල් සංවර්ධන නිලධාරී වරයෙකු මඟින් පරික්ෂා කර ඔවුන්ගේ නිර්දේශ යටතේ පමණක් ලබා ගත හැක. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල වලින් මිලදී ගත හැක.

- පරපෝෂී නළ

ඔබගේ පොල් ඉඩම පොල් දළඹු උවදුරට ගොදුරු වී තිබේ නම් පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන් එය පරික්ෂා කර මෙම පරපෝෂී නල වල වූ පරපෝෂීන් ඉඩමට මුදා හරිනු ඇත. එම පරපෝෂීන් ඉඩමේ වූ පොල් කොල දළඹුවන් විනාශ කරනු ලබයි.